පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 164
ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டு தொடர் இல - 164
ஔடத உற்பத்திகள்,வழங்கல்கள் மற்றும் ஒழுங்குபடுத்தல் இராஜாங்க அமைச்சு

பாராளுமன்ற அரச கணக்குகள் குழுவினால் முன் வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியல் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series Number – 164
State Ministry of Production, Supply and Regulation of Pharmaceuticals

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු/ ලබා දුන් නියෝග	**අඩුපාඩු නිවැරදි කිරීමට හා නියෝග ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග හා වත්මන් තත්වය**
01.	ඖෂධ ප්‍රසම්පාදනය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුගත නොවීම. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති ක්‍රියාකාරී සැලැස්මට අනුව ඖෂධ වට්ටෝරු සමාලෝචන කමිටුව වසරකට වරක් රැස් වී මිලදී ගත යුතු ඖෂධ වර්ග, මිලදී ගත යුතු ප්‍රමාණය, භාවිතයෙන් ඉවත් කළ යුතු ඖෂධ වර්ග, ඖෂධ පිරිවිතරයන් සම්බන්ධයෙන් ඇතිවන ගැටළු වැනි කාරණා සමාලෝචනය කළ යුතුවේ. එනමුත් 2011 වසරින් පසු එම කමිටුව රැස්වී නොතිබුණු බැවින් එම කමිටුවේ නිර්දේශයකින් තොරව 2011 වසරේ සිට 2016 වර්ෂය දක්වා රුපියල් මිලියන 10,193 ක් වටිනා වෛද්‍ය සැපයීම් අයිතම 4619 ක් මිලදී ගෙන තිබීම. වට්ටෝරු සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්වීම පිළිබඳ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කර ඇත.	වට්ටෝරු සමාලෝචන කමිටු වාර්ෂිකව පැවැත්වීම ප්‍රායෝගික නොවූ බැවින් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝගය අනුව, • වසර දෙකකට (02) වරක් ඖෂධ වට්ටෝරු සමාලෝචන කමිටු පැවැත්වීමටද • ශල්‍යාගාර සහ රසායනාගාර සම්බන්ධයෙන් වන වට්ටෝරු සමාලෝචන කමිටු වසර තුනකට (03) වරක් පැවැත්වීමටද 2022.02.01 දින මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. (ඇමුණුම 01)
02.	වෛද්‍ය සැපයීම් ඇස්තමේන්තුගත කිරීමේ ක්‍රියාවලියේ දුර්වලතා. 2017 වර්ෂය වන විට වෛද්‍ය සැපයීම් අයිතම 19,844 ක් භාවිත කර තිබුණු බව වෛද්‍ය සැපයුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MSMIS) මඟින් අනාවරණය වීම භාවිතයෙන් ඉවත් කළ ඖෂධ වෛද්‍ය සැපයීම් කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් ඉවත් කර නොමැති බව නිරීක්ෂණය කළ කාරක සභාව, භාවිතයෙන් ඉවත් කළ ඖෂධ තොරතුරු පද්ධතියෙන් ඉවත් කිරීමට හා අලුතෙන් භාවිතයට එකතු වන ඖෂධ එම පද්ධතියට ඇතුළත් කොට, එම පද්ධතිය යාවත්කාලීන කරන ලෙස නියෝග කර ඇත.	පසු විපරම් සඳහා අවශ්‍ය වන බැවින් භාවිතයෙන් ඉවත් කල ඖෂධ අයිතමයන් වෛද්‍ය සැපයීම් පද්ධතියෙන් සම්පූර්ණයෙන් ඉවත් කල නොහැකිය. නමුත් මෙම අයිතම සඳහා ඇස්තමේන්තු ලබා ගැනීම සහ ඇණවුම් කිරීම පද්ධතිය මඟින් සීමාකර ඇත. 2022.10.19 දින වන විට පද්ධතියේ ඇති ක්‍රියාකාරී (Active Items) ගණන 12,754 වන අතර එය පහත පරිදි වේ. ඖෂධ - 1,151 ශල්‍ය - 8,134 රසායනාගාර - 3,469 එකතුව - **12,754**
03.	ඖෂධ වෙළඳ නාමයෙන් මිලදී ගැනීම. ඇස්තමේන්තුගත නොකළ අයිතම 10ක නියැදියක් පරීක්ෂා කිරීමේදී අයිතම 7 ක් සඳහා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂයේ ජුනි දක්වා අවස්ථා 243 කදී රු.මිලියන 168 ක් වැයකර රෝගියාගේ නමට ලබා දෙන (Name Patient) ඖෂධය මිලදී ගෙන ඇති බව	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඖෂධ ඇනවුම් කරනු ලබන්නේ ඖෂධ නාමයෙන් පමණක් වේ. නමුත් රෝගීන්ගේ නමට ලබා ගන්නා පිළිකා නාශක බෙහෙත් වන (උදා- Trastuzumab) ජීව විද්‍යාත්මක ඖෂධ වල ප්‍රමිතිය මැන බැලීමට අපහසු බැවින්, දෙවන අවස්ථාවට ළඟා වී ඇති පිළිකා රෝගීන්ට එම මුල් නිෂ්පාදනයම (Original Product) වෛද්‍යවරුන් නිර්දේශ කරයි.

	අනාවරණය විය. එසේම Herceptin නැමැති මුල් ඖෂධය ඉවත් කර මේ යටතේ අධික මිලක් සහිත රෝගියාගේ නමට ලබා දෙන Trastuzumab නැමැති පිළිකා ඖෂධය Herticad නැමැති වෙළඳනාමයෙන් 2018 සහ 2019 වර්ෂවල අවස්ථා 14 කදී රු.මිලියන 891 ක් වැය කර දේශීය සැපයුම්කරුවකුගෙන් මිලදී ගෙන තිබූ බවත් අනාවරණය විය. මෙහිදී අඩු මිල ගණන් ප්‍රතික්ෂේප කර මෙම ඖෂධය මිලදී ගැනීම නිසා රුපියල් මිලියන 230.9 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී ඇත. රෝගියාගේ නමට ලබා දෙන ඖෂධ අත්‍යාවශ්‍යම අවස්ථාවලදී පමණක් මිලදී ගැනීමට කටයුතු කරන මෙන් කාරක සභාව නියෝග කර ඇත.	ඒ අනුව රෝගියාගේ නමට ලබා දෙන ඖෂධ අත්‍යාවශ්‍ය අවස්ථාවල දී පමණක් වෙළඳ නාමයෙන් මිල දී ගනු ලැබේ. කෙසේ වුවද විශේෂඥ වෛද්‍යවරුන්ගේ නිර්දේශයට අමතරව රාජ්‍ය අමාත්‍යාංශය මගින්ද ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) මගින්ද ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) ආයතනය මගින්ද මේ සඳහා අනුමැතිය ලබා ගත යුතුය.
04.	ඖෂධ වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව රෝහල් මඟින් දේශීය වෙළඳපලින් ඖෂධ මිලදී ගැනීම. 2020 වසරේදී රිජ්වේ ආර්යා ළමා රෝහල මඟින් රු. මිලියන 9 ක ඖෂධ මෙලෙස වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව මිලදී ගෙන තිබීම.	විශේෂඥ වෛද්‍යවරුන් නිර්දේශ කළහොත් පමණක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය හා සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතිය ඇතිව වට්ටෝරුවේ සඳහන් ඖෂධ මිලදී ගැනීම සිදු කරනු ලැබේ. නමුත් මේ අයුරින් ඖෂධ මිලදී ගැනීම මේ වන විට අවම මට්ටමක පවතින අතර නිතර නිතර මිලදී ගන්නා ඖෂධ විශාල ප්‍රමාණයක් වට්ටෝරුගත කර රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ලබා ගැනීමට කටයුතු කර ඇත.
05.	වෛද්‍ය සැපයීම් ගබඩා සුදුසු තත්ත්වයෙන් පවත්වා නොතිබීම වෛද්‍ය සැපයීම් අංශය සතු ගබඩා වල උෂ්ණත්වය නිසි ලෙස පවත්වාගෙන නොමැති බවද, වෛද්‍ය සැපයීම්, මධ්‍යම ඖෂධ ගබඩාවේ හා රෝහල් වල කොරිඩෝවල තැන්පත් කර ඇති බව නිරීක්ෂණය විය. මෙසේ නියමිත පරිදි ඖෂධ ගබඩා නොකිරීම හේතුවෙන් 2011 වසරේ සිට 2020 වසර දක්වා රුපියල් මිලියන 6259 ක ඖෂධ තත්ත්වයෙන් අසමත් බව හඳුනා ගන්නා විටත් ඉන් 99%ක් රෝගීන් වෙත ලබා දී ඇති බවද නිරීක්ෂණය විය. මෙම තත්ත්වයෙන් අසමත් ඖෂධ පිරිවැය සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකි වී ඇත. ඖෂධවල සුරක්ෂිතතාවය සුරැකෙන පරිදි ඖෂධ ගබඩා කිරීම සඳහා එම වැඩ කටයුතු අවසන් කරන මෙන් කාරක සභාව නියෝග කර ඇත.	මේ වන විට උෂ්ණත්ව පාලනය කළ හැකි වර්ග අඩි 28,000 ක ගබඩාවක් වේයන්ගොඩ ප්‍රදේශයෙන්ද වර්ග අඩි 49,000 ක ප්‍රමාණයෙන් යුතු ගබඩාවක් ශාවස්තිපුරයෙන් ද ලබා ගෙන ඇත. මීට අමතරව ඖෂධ ගබඩා පහසුකම් නැංවීමේ ව්‍යාපෘතිය මඟින් 2020 වර්ෂය තුල මිලියන 65.37ක් හා 2021 වර්ෂය තුල මිලියන 233.37ක් වැය කර ආයතන 81 ප්‍රාදේශීය ගබඩා පහසුකම් වැඩි දියුණු කර ඇත.

06.	• ඇස්තමේන්තු ගත නොකළ අයිතම තුළ ඇස්තමේන්තුගත කළ හැකි මිල අධික අයිතම පැවති නමුත් ඒ පිළිබඳව නොසලකා එම අයිතම ඇස්තමේන්තුගත නොකර තරඟකාරීත්වයෙන් බැහැරව අධික මිලකට දේශීය වශයෙන් මිලදී ගෙන තිබීම. • ඖෂධයක් ඇස්තමේන්තුගත කළ විට ලෝක ව්‍යාප්ත ටෙන්ඩර් කැඳවීම මඟින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් මිලදී ගන්නා බවත්, රෝගියාගේ නමට ලබා දෙන ඖෂධ ඇස්තමේන්තුගත නොකර, දේශීය වෙළඳපොලින් මිලදී ගන්නා බවත් නිරීක්ෂණය විය. නමුත් Trasruzumab නැමැති ඖෂධය රෝගියාගේ නමට ලබා දෙන ඖෂධයක් වුවද එය ඇස්තමේන්තුගත කර විශාල අලාභයක් සහිතව ආනයනය කිරීම හා සමහර ඖෂධ ඇස්තමේන්තුගත කිරීමෙන් තොරව දේශීය වෙළඳපලින් මිලදී ගැනීම නිරීක්ෂණය විය. Trasruzumab ඖෂධය දේශීය වශයෙන් මිලදී ගැනීමේදී විශාල වියදමක් වැය වන බැවින් අත්‍යාවශ්‍ය අවස්ථාවලදී පමණක් එම ඖෂධ මිලදී ගැනීමට කටයුතු කිරීම මඟින් මෙසේ දේශීයව මිලදී ගැනීම අවම කරන මෙන් නියෝග කර ඇත. එමෙන්ම, රෝහල්වලින් දේශීයව මිලදී ගන්නා ඖෂධ පිළිබඳ ලේඛනයක් සකස් කොට එය විගණකාධිපතිවරයා වෙත ලබා දෙන මෙන්ද කාරක සභාව නියෝග කර ඇත.	විශේෂඥ වෛද්‍යවරුන්ගේ නිර්දේශය මත අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත ඇස්තමේන්තුගත නොකර දේශීය වශයෙන් මෙම ඖෂධ මිලදී ගන්නා නමුත් ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට පත් කර ඇති කමිටුවක් මඟින් එම ඉල්ලීම් විශ්ලේෂණය කරනු ලබන අතර විශාල වශයෙන් ඇස්තමේන්තුගත නොකර මිලදී ගන්නා ඖෂධ හදුනාගෙන (ඇමුණුම 02) එම ඖෂධ ලෝක ව්‍යාප්ත ටෙන්ඩර් මඟින් මිලදී ගැනීමට කටයුතු කරනු ලැබේ. ඊට අමතරව ජාතික ඖෂධ නියාමන අධිකාරිය මඟින්ද අදාල ඖෂධය මෙරට භාවිතයට සුදුසුද, අවශ්‍ය ද යන්න අධ්‍යනය කිරීමෙන් පසු ඒ සඳහා අනුමැතිය ලබා දෙනු ලැබේ.
07.	ප්‍රසම්පාදන කාල සටහනකට අනුව කටයුතු කිරීම. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු මට්ටමේ ඇණවුම් සඳහා මාස 11-12 ක් අතර කාලයක් ගත කළ හැකි වුවද, 2020 වර්ෂයේ ඇතැම් ඖෂධ ප්‍රසම්පාදනය සඳහා මාස 14 සිට මාස 48 දක්වා කාලයක් ගත කිරීම, ප්‍රසම්පාදන ලිපි ගොනු සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට මාස 7 සිට 24 දක්වා කාලයක් ගත වීම හා මෙම ප්‍රමාදයන් නිසා ප්‍රසම්පාදන කාලසීමාව පසු වීමෙන් එම ඖෂධ වැඩි මිලට දේශීය වෙළඳපොලින් මිලදී ගැනීමට සිදු වීම. නිසි ප්‍රසම්පාදන සැලැස්මකට හා ප්‍රසම්පාදන කාලසටහනට අනුව කටයුතු කිරීමට හැකිවන සේ ඉලෙක්ට්‍රොනික පද්ධතියක් (ERP) සකස් කිරීමට හෝ පවතින පද්ධතියේ අඩුපාඩු සකස්	රෝගීන්ගේ ඖෂධ පාරිභෝජන රටාව පදනම් කර ගනිමින් (Consumption Base) ඖෂධ ඇස්තමේන්තු සකස් කිරීමටත් හැකිවන පරිදි හා එම තොරතුරු මත පදනම්ව නිසි ප්‍රසම්පාදන සැළැස්මකට හා ප්‍රසම්පාදන කාලසටහනකට අනුව කටයුතු කිරීමට හැකි වන පරිදි ස්වස්ථ නමින් නව පරිගණක පද්ධතියක් හදුන්වා දීම සඳහා 2022.01.19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි. (ඇමුණුම 03) ඒ අනුව අදාල පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කර සැපයුම්කරුවන් තෝරාගෙන ඇති අතර ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමග එක්ව දත්ත ගබඩා කිරීම හා ජාල ගත කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙම පද්ධතිය ක්‍රියාත්මක වීමත් සමඟ ප්‍රමාදයන් අවම කොට ප්‍රසම්පාදන කාර්යයන් අවසන් කිරීමට හැකියාව ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝගය පරිදි නිසි ප්‍රසම්පාදන සැළැස්මකට හා ප්‍රසම්පාදන

	කර එය වැඩි දියුණු කර ගැනීමට කටයුතු කොට ඒ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන මෙන් කාරක සභාව විසින් නියෝග කර ඇත.	කාලසටහනකට අනුව කටයුතු කිරීමට හැකි වන නව ඉලෙක්ට්‍රොනික පද්ධතියක් (ERP) සකස් කිරීම හෝ පවතින පද්ධතිය වැඩිදියුණු කර භාවිතා කොට ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කොට ඒ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ලබා දීමට කටයුතු කර ඇත.
08.	• සැපයුම්කරුවන්ගෙන් සිදුවන ප්‍රමාදය නිසා අවශ්‍ය වෛද්‍ය සැපයීම්, වෛද්‍ය සැපයීම් අංශය මඟින් දේශීය වෙළඳපලින් මිලදී ගැනීම නිසා වැයවන අතිරේක පිරිවැය. • සැපයුම්කරුවන්ගෙන් සිදුවන ප්‍රමාදය නිසා දේශීය වෙළඳපලින් මිලදී ගැනීමට සිදු වුවහොත් සැපයුම්කරුවන්ගෙන් අලාභය අය කර ගත යුතු නමුත් සත්‍ය වශයෙන්ම ප්‍රමාදය සඳහා කවර පාර්ශවයක් වගකිව යුතුද යන්න සොයා ගැනීමට ක්‍රමවේදයක් නොමැති වීම. සැපයුම්කරුවන්ගේ ප්‍රමාදය නිසා ඖෂධ දේශීය වෙළඳපලින් මිලදී ගැනීම වැළැක්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින්ද සුදුසු ක්‍රමවේදයක් සකසන ලෙස නියෝග කර ඇත. සැපයුම ප්‍රමාද වන ඖෂධ පිළිබඳ විශ්ලේෂණයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කමිටුව මඟින් සිදු කොට සවිස්තර වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස නියෝග කර ඇත. • රොහල් මඟින් දේශීය වෙළඳපොලින් ඖෂධ මිලදී ගැනීමේදී වැය වන අතිරේක වියදම අයකර ගැනීමේ ක්‍රමවේදය.	ණයවර ලිපි කල් ඉල්ලීමේදී කමිටුවක් හරහා එය සිදු කර ප්‍රමාදය සඳහා ගාස්තුවක් අය කරන අතර පසුගිය මාස 5 ක කාලසීමාවකට මිලියන 70 ක් ප්‍රමාද ගාස්තු අයකර ගෙන ඇත. වෛද්‍ය සැපයුම් අංශයට වෛද්‍ය සැපයුම් ලැබීමෙන් පසු තොග ලැබීම් පත්‍ර ලේඛනයකට ඇතුළත් කරනු ලබන අතර එමඟින් ප්‍රමාදය හඳුනාගත හැකි වේ. සේවකයන් නිසා ප්‍රමාදයක් සිදු වී ඇත්නම් මෙම ක්‍රමය හරහා හඳුනා ගැනීමේ හැකියාව පවතී. අදාල වාර්තාව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත CA/AQ/FCC/02/COPA/2019(iii) අංක දරන 2022.06.22 දිනැති ලිපිය මඟින් යොමු කර ඇත.
09.	අමාත්‍යාංශය මඟින් චක්‍රලේඛ නිකුත් කිරීම ප්‍රමාද වීම නිසා තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් රෝගීන් වෙත නිකුත් කර තිබීම.	හඳුන්වාදීමට යෝජිත නව ස්වස්ථ පරිගණක පද්ධතිය, ප්‍රාදේශීය රෝහල් කරා ව්‍යාප්ත කිරීම මඟින් මෙම අඩුපාඩුව මහහරවා ගැනීමේ හැකියාව පවතී.
10.	තත්ත්වයෙන් අසමත් ඖෂධ සඳහා අලාභය සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමේ ප්‍රගතිය. තත්වයෙන් අසමත් ඖෂධ සඳහා අලාභය සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම් වල ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ලබා දෙන ලෙස නියෝග කර ඇත. වෛද්‍ය සැපයුම් අංශය විසින් තත්ත්වයෙන් අසමත් ඖෂධ හෝ වෛද්‍ය සැපයුම් පිරිවැය	අදාල වාර්තාව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත SM/PSRP/07/COPA/20(1) අංක දරන 2022.03.29 දිනැති ලිපිය මඟින් යොමු කර ඇත. අදාළ ගෙවීම් සිදු නොකළ සැපයුම්කරුවන් අසාදුලේඛන ගත කර නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් අය කර ගැනීම වෙනුවට අදාළ සැපයුම්කරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතු බව කාරක සභාව නියෝග කර ඇත.	
11.	ඇතැම් වෛද්‍ය සැපයුම් බහාලුම්වල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර නොතිබීම. රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර නොමැති ඖෂධ පිළිබඳ වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ලබා දෙන මෙන් කාරක සභාව නියෝග කර ඇත.	ඉතා කුඩා ප්‍රමාණයක් අත්‍යාවශ්‍ය අවස්ථාවකදී මිලදී ගැනීම, පරිත්‍යාග වශයෙන් ලැබෙන ඖෂධ පාලිත තත්වයට යටත්ව භාර ගැනීම, ඇතැම් අවස්ථාවන් වලදී අත්‍යාවශ්‍ය ඖෂධ ඔසුසැල් මඟින් සුලු ප්‍රමාණයක් මිලදී ගැනීම, නාමික ඖෂධ මිලදී ගැනීම, Covid තත්වය තුලදී අවශ්‍යතාවය මත ඖෂධ මිලදී ගැනීම වැනි අවස්ථාවල දී රාජ්‍ය ලාංඡනය නොමැතිව ඖෂධ ලබා ගැනීමට සිදු වී ඇත. අනෙකුත් සෑම අවස්ථාවකදීම රාජ්‍ය ලාංඡනය සහිතව මිලදී ගැනීම සිදු කරනු ලබයි. රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර නොමැති ඖෂධ සැපයීම් පිළිබඳ වාරතාව රාජ්‍ය ගිණුම්කාරක සභාව වෙත SM/PSRP/07/COPA/20(1) අංක දරන 2022.03.29 දිනැති ලිපිය මඟින් යොමු කර ඇත.
12.	වෛද්‍ය සැපයීම් ලද වහාම තොග ලැබීම් පත්‍ර (GRN) නිකුත් නොකිරීම. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් මිලදී ගනු ලබන ඖෂධ ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් හරහා වෛද්‍ය සැපයීම් අංශය වෙත ප්‍රවාහනය කරනු ලබන බව අනාවරණය වී ඇති බවත් එම ඖෂධ ගබඩාවල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා විශාල වටිනාකමක් සහිත වෛද්‍ය සැපයීම්, ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් වෙතින් භාර නොගෙන ගබඩා ඉදිරිපිට කොරිඩෝවල තබා ඉඩ පහසුකම් ලද පසු ඒවා ගබඩාවලට භාර ගෙන තොග ලැබීම් පත්‍ර නිකුත් කිරීම. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙතින් ගබඩා වෙත ඖෂධ ලද වහාම තොග ලැබීම් පත්‍ර නිකුත් කිරීමට ගෙන ඇති පියවර පිළිබඳ වාර්තාවක් මසක් තුළ කාරක සභාව වෙත ලබා දෙන ලෙස නියෝග කර ඇත.	අදාල වාර්තාව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත SM/PSRP/07/COPA/20(1) අංක දරන 2022.03.28 දිනැති ලිපිය මඟින් යොමු කර ඇත. (ඇමුණුම 04) මෙම තත්වය මඟ හරවා ගැනීම සඳහා Pricing and Check Unit නැමැති නව ඒකකයක් 2021/11/25 දින වෛද්‍ය සැපයුම් අංශයෙහි පිවිසුම ඉදිරිපිට ස්ථාපිත කර ඇත. එසේම එහි සේවය සඳහා නිලධාරීන් 04 දෙනෙකු මේ වන විට සේවා මුර ක්‍රමය යටතේ උදේ 8.00 සිට රාත්‍රී 8.00 දක්වා සේවයේ නිරතවේ. මෙය රජයේ සියළුම රාජකාරි දිනයන්හිදී ක්‍රියාත්මක වේ. මෙම ඒකකය ස්ථාපිත කිරීමට පෙර වෛද්‍ය වෛද්‍ය සැපයීම් අංශය වෙත තොග ලද පසු ඊට අදාල කාර්යයන් සම්පූර්ණ කිරීමට විවිධ අංශ වලට සැපයුම්කරු යායුතු වූ අතර මෙම නව ඒකකය පිහිටුවීම තුළින් එම සියළු කාර්යයන් එම ඒකකයෙන් සිදුකර ගත හැකිවේ. එමඟින් පෙර පැවති ගැටළුකාරී තත්වයෙන් මහහැරී ගොස් මෙම ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම වී ඇත. මේ වන විට වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබෙන සියලු තොග භාරගෙන එක් දිනයක් ඇතුලත තොග ලැබීම් පත්‍ර (GRN) නිකුත් කරනු ලැබේ.මේ වන විට වේයන්ගොඩ, ශ්‍රාවස්ථිපුර, වැල්ලවත්ත අංගොඩ හා දිගන ප්‍රාදේශීය ගබඩාවන් සඳහා ද (GRN) නිකුත් කිරීමේ පහසුකම් ලබා දී ඇත.

13.	තොග ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම. 2015.12.31 දිනට වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩාවල පැවති පිරිවැය රු.මිලියන 43ක තොග ඌනතා සම්බන්ධයෙන් කටයුතු කර නොතිබීම.	ගබඩා නිලධාරීන් 11 දෙනෙකුට අදාලව පවතින ඌනතා තොග වටිනාකම අඩුකර ගැනීම පහත දැක්වේ. 2020.12.31 දිනට අයකර ගෙන තිබූ වටිනාකම - රු.3,261,404.00 2021.01.01 සිට 2022.09.30 දක්වා අයකර ගෙන ඇති වටිනාකම - රු.179,970.00 2022.09.30 දිනට අයකරගෙන ඇති වටිනාකම - රු.3,441,374.00
14.	වෛද්‍ය සැපයීම් කල් ඉකුත් වීමේ ප්‍රවණතාවය. • 2015 වසරේ සිට 2017 වසර දක්වා කල් ඉකුත් වූ ඖෂධවල පිරිවැය රු.මිලියන 1,122 ක්ද 2018 වසරේ රු.මිලියන 16 ක් ද 2019 වසරේ රු.මිලියන 240 ක් ද, 2020 වසරේ රු.මිලියන 208 ක් බවද අනාවරණය වී ඇත. • 2017- 2018 වසරේ හෝමාගම මූලික රෝහලේ තයිරොක්සින් 50mcg වාර්ෂික ඇස්තමේන්තුව 600,000 ක් වුවද එය 6,000,000 ක් ලෙස වැරදියට ඇස්තමේන්තු කර, මිලදී ගැනීම නිසා එම ඖෂධ විශාල ප්‍රමාණයක් කල් ඉකුත් වූ බවද, එම ඖෂධවල වටිනාකම රු.මිලියන 3.4ක් බවද අනාවරණය වී ඇත.	හඳුන්වාදීමට යෝජිත ස්වස්ථ පරිගණක පද්ධතිය රෝහල් මට්ටමින් ක්‍රියාත්මක කිරීමෙන් පසු ඖෂධ පරිභෝජන රටාව හඳුනාගත හැකි අතර ඒ අනුව පරිභෝජන රටාව මත පදනම්ව ඖෂධ ඇස්තමේන්තු ගත කිරීමට කටයුතු කරනු ලැබේ.
15.	• මිලදී ගනු ලබන සියළුම වෛද්‍ය සැපයීම්වල නියැදියක තත්ත්වය පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම හා දැනට ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කරන ආකාරය. • ජාතික ඖෂධ නියාමන අධිකාරියේ රසායනාගාරයේ සංවර්ධන කටයුතු. • ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නොවන ඖෂධ මෙරටට ගෙන්වීම. තත්ත්වයෙන් අසමත් ඖෂධ හඳුනා ගැනීමේ ක්‍රමවේද පිළිබඳ යෝජනාවලියක් අමාත්‍ය මණ්ඩලය මඟින් පත් කරන ලද කමිටුවක් මඟින් සකස්කොට එය කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නියෝග කර ඇත.	ඇතැම් වෛද්‍ය සැපයීම් වල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා මෙරට පහසුකම් නොමැති අතර එම පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආධාර ඇතිව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ රසායනාගාරය වැඩි දියුණු කරමින් පවතී. එම කටයුතු වසර 2 ක් ඇතුලත නිම කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ජාතික ඖෂධ නියාමන අධිකාරිය අනුමත නොකරන ලද කිසිදු ඖෂධයක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් මෙරටට ගෙන්වීමට කටයුතු නොකරයි. ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත පවරා දෙනු ලබන යෝජිත නව ඉඩමට අදාල පූර්ව සාකච්ඡාවන්ට අනුව අදාල සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරිය තීරණය කර ඇත.

	ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නාරාහේන්පිට පිහිටි රසායනාගාරය දැනට කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව පවතින ඉඩමක් බැවින් එම ඉඩම පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කොට අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙසත්, අක්කර 2.5ක ඉඩමක මෙම ගොඩනැඟිලි සංකීර්ණය ඉදි කිරීමට යෝජිත බැවින් තාක්ෂණික වශයෙන් අවශ්‍යතාවයක් නොමැති නම් අක්කර 1 ක පමණ භූමි භාගයක එය ඉදි කිරීමට හැකිවන පරිදි එම සැලසුම නැවත සමාලෝචනය කිරීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස ද නියෝග කර ඇත.	**ඒ සඳහා කැබිනට් පත්‍රිකාවට කරුණු දැක්වීම සඳහා, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති ලිපිය (ඇමුණුම 05)** මඟින් අනවසරයෙන් පදිංචිව සිටින්නන් සහ එහි නිල නිවාසයන්හි පදිංචිකරුවන් නැවත ස්ථාන ගත කරලීමට සහ ඔවුන් වෙනත් ස්ථානයක පදිංචි කරලීමට අවශ්‍ය ඉදිකිරීම් සඳහා වැයවන මුදල සම්බන්ධ ඇස්තමේන්තුවක් සහ මෙම අනවසරයෙන් පදිංචිව සිටින්නන් ඉවත්කර යෝජිත නව ඉඩම ඖෂධ නියාමන අධිකාරිය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට ගතවන කාල රාමුව පිළිබඳ විස්තර ඉල්ලා ඇත.

ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල,
මහාධ්‍ය අමාත්‍ය.

9